# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1721/20 – 2011 අගෝස්තු 30 වැනි අඟහරුවාදා – 2011.08.30**

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: CIE/28/2002.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්

පී. එන්. විල්සන් මයා, අංක 29, ඉසදීන් ජනපදය, වැලිගම්පොල, නාවලපිටිය.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

(1) කහවත්ත ප්ලාන්ටේෂන් ලිමිටඩ්, අංක 52, මාලිගාවත්ත පාර, කොළඹ 10. (2) බාකේපල් වත්ත, කැටබුලා, නාවලපිටිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, නො. 570/B /1හි, පී. නවරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: CIE/28/2002.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්

පී. එන්. විල්සන් මයා, අංක 29, ඉසදීන් ජනපදය, වැලිගම්පොල, නාවලපිටිය.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

(1) කහවත්ත ප්ලාන්ටේෂන් ලිමිටඩ්, අංක 52, මාලිගාවත්ත පාර, කොළඹ 10. (2) බාකේපල් වත්ත, කැටබුලා, නාවලපිටිය.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

1990.10.01 දින සිට නාවලපිටිය, කැටබුලා, බාකේපල් වත්තේ සහකාර ක්ෂේත්‍ර නිලධාරියෙකු ලෙස සේවය කළ පී. එන්. විල්සන් මහතාගේ සේවය 1998.04.02 දින සිට අත්හිටුවීමෙන් එම සේවකයාට යම් අගතියක් සිදුවූයේද, එසේ සිදු වූයේ නම් ඔහුට කුමන් සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2011 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 - 437

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.